## 2018 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

**උතුරු පළාත් සභාව**

උතුරු පළාතට අයත් පහත සඳහන් දිස්ත්‍රික්ක වලට 2018 වර්ෂය සඳහා භාණ්ඩ , සේවාවන් සැපයීම සඳහා දේශිය සැපයුම්කරුවන්ගෙන් ලියාපදිංචි වීමට කැමති **යාපනය, වවුනියාව, මන්නාරම, කිළිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රීක්ක වලට උසස් තත්ත්වයේ සැපයුම්කරුවන්ගෙන්, නිෂ්පාදකයන්ගෙන් , කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව දේශිය මට්ටමින් සැපයුම් ලබාගැනිමේ දි ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන දේදුණු පිටුවේ **(Rainbow Pages)** නම් සඳහන් සැපයුම්කරුවන්ගෙන් ද මිළ ගණන් කැඳවනු ලැබේ.

1 යාපනය 2.වවුනියාව
3.මන්නාරම 4.කිළිනොච්චිය
5.මුලතිව්

| **ඇමුණුම් අංකය:- "G"** | |
|---|---|
| **උප ඇමුණුම් අංකය** | **භාණ්ඩ - විස්තරය** |
| G-1 | කාර්යාලීය ගෘහභාණ්ඩ |
| G-2 | කාර්යාලීය උපකරණ |
| G-3 | ලිපි ද්‍රව්‍ය (Stationery) |
| G-4 | පොත්පත්, කාලින නිකුත් කිරීම් |
| G-5 | ගොඩනැගිලි ද්‍රව්‍ය හා ගොඩනැගිලි බෙදා වෙන්කිරීම හා සැරසීම |
| G-6 | විදුලි උපාංග සහ සවිකිරීම්, විදුලි උපකරණ හා අනුකරණ භාණ්ඩ |
| G-7 | මුද්‍රණ ද්‍රව්‍ය |
| G-8 | පරිගණක සහ උපාංග |
| G-9 | ප්‍රජාවට අවශ්‍ය යහඋපකරණ |
| G-10 | මොටර් වාහන කොටස් |
| G-11 | පොදු උපකරණ හා ගෘහ භාවිතය සඳහා වන භාණ්ඩ |
| G-12 | අධ්‍යාපන කටයුතු සඳහා වන උපකරණ |
| G-13 | ක්‍රීඩා උපකරණ |
| G-14 | සංගීත භාණ්ඩ |
| G-15 | වෛද්‍ය උපකරණ සහ ඖෂධ |
| G-16 | ආයුර්වේද / දේශිය ඖෂධ |
| G-17 | ආයුර්වේද බෙහෙත් සරක්කු සහ කුළු බඩු වර්ග |
| G-18 | රෝහල්වලට ආහාර සැපයීම (වියළි ආහාර පමණි) |

| | |
|---|---|
| G-19 | පිසූ ආහාර හා සිසිල් බීම |
| G-20 | කෘෂිකාර්මික යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ සහ ඒවාට අදාළ මෙවලම් |
| G-21 | කෘෂිකාර්මික භාණ්ඩ, පොහොර වර්ග සහ කෘෂි රසායන වර්ග |
| G-22 | කෘෂි බීජ සහ රෝපන ද්‍රව්‍ය |
| G-23 | සත්ත්ව ආහාර හා වෙනත් ද්‍රව්‍ය |
| G-24 | සත්ත්වයන් සඳහා අවශ්‍ය බෙහෙත් |
| G-25 | ධීවර කර්මාන්තයට අදාළ භාණ්ඩ |
| G-26 | කර්මාන්ත අමු ද්‍රව්‍ය |

| **ඇමුණුම් අංකය : "S" සේවාවන් -විස්තරය** | |
|---|---|
| **උප ඇමුණුම් අංකය** | |
| S-1 | ලිපි ශීර්ෂ පොත්, ප්‍රකාශන මුද්‍රණ, පෝස්ටර්, බැනර් මුද්‍රණය, නාම පුවරු, සංකේත පුවරු, සමරු ඵලක, පොත් බැඳීම, මුද්‍රණ රාමු(Block)සෑදීම, රබර් මුද්‍රා, දිනමුද්‍රා සෑදීම . |
| S-2 | කාර්යාල ලිබඩු අලුත්වැඩියා කිරීම |
| S-3 | කාර්යාල ඡායා පිටපත් යන්ත්‍ර, යතුරු ලියන, රෝනියෝ යන්ත්‍ර සහ විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීම. |
| S-4 | පරිගණක සහ ප්‍රින්ටර් අලුත්වැඩියා කිරීම සහ සේවාකිරීම |
| S-5 | ශීතකරණ, විදුලි උපකරණ සහ විදුලි වයර් අලුත්වැඩියා කිරීම සහ සේවාකිරීම |
| S-6 | ආරක්ෂක සේවා සැපයීම |
| S-7 | පවිත්‍රතා සේවා සැපයීම, ගොඩනැගිලි මහල්, තිර රෙදි, දොරජනෙල් පිරිසිදු කිරීම. |
| S-8 a) or b) | **(a) වාහන අලුත්වැඩියා කිරීම:- අභ්‍යන්තර අලුත්වැඩියාව.**<br>ඇන්ජිම හා වාහන කොටස් අලුත්වැඩියාව හා අනෙකුත් අලුත්වැඩියාවන්<br>**(b) වාහන අලුත්වැඩියා කිරීම:- බාහිර අලුත්වැඩියාවන්**<br>තහඩු (Tinkering) අලුත්වැඩියාව හා තීන්ත ගෑම |
| S-9 | **වාහන නඩත්තුව**, ධාවන සටහනට අනුව සේවාකටයුතු කිරීම, රෝද සමානදැයි (alignment) පරික්ෂාකිරීම, ටයර් මාරු කිරීම වාහන ඇතුලත සේවා කිරීම සහ ඔප දැමීම |
| S-10 | කෘෂිකාර්මික උපකරණ නිෂ්පාදනය කිරීම/ මෝස්තර සැළසුම් කිරීම සහ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ උපකරණ අලුත්වැඩියා කිරීම |
| S-11 | කුලියට හෝ බද්දට වාහන සැපයීම (**Passenger Vehicle**) |

## කොන්දේසි

1 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2018 වර්ෂය සඳහා පමණක් වළංගුවේ.

2 දේශිය සැපයුම්කරුවන් ලියාපදිංචිකරන ලද ලේඛණයේ සහ දේශිය මට්ටමින් සැපයුම් ලබාගැනිමේ දි ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් වාර්ෂිකව නිකුත්කරනු ලබන දේදුණු පිටුවේ (Rainbow Pages) නම් සදහන් සැපයුම්කරුවන්ගෙන් ද සාමාන්‍යයෙන් මිළ ගණන් කැඳවනු ලැබේ. කෙසේ වෙතත්, භාණ්ඩ මිලදි ගන්නන්ට වෙනත් මාර්ග වලින්ද මිල ගණන් කැඳවිමට හිමිකම් ඇත.

3 අයදුම් පත් ලියාපදිංචිකිරිම විධිමත් පාර්ශවයන්ට සහ ඇස්තමේන්තුවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබේ. අසත්‍ය තොරතුරු සපයා ඇත්නම්, අයදුම්පත් ප්‍රතික්ෂේප නරනු ලැබේ.

4 ලියාපදිංචිය සදහා ලැබෙන අයදුම්පත්‍ර කිසිදු හේතුන් දැන්විමෙන් තොරව භාර ගැනිමටත්, ප්‍රථික්ෂේප කිරිමටත් අයිතිය ප්‍රධාන ලේකම් සතුවේ.

5 මිල ගණන් කැදවිමේ දි නිවැරදි මිල ගණන් සපයා නොමැති හෝ ඉල්ලා සිටින භාණ්ඩ නියමිත කාලයතුල දි සපයන ලද ආදර්ශයන්ට අනුව සැපයිමට අපොහොසත් වන ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන්ගේ නම් පෙර දැනුම් දිමකින් තොරව ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.

6 ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සදහන් භාණ්ඩ හෝ සේවාවන්ට පමණත් සැපයුම්කරුවන් ලියාපදිංචි නරණු ලැබේ.

7 අදාළ භාණ්ඩ හෝ සේවාවන් සැපයීම සඳහා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචිකරන්නන් විසින් සපයනු ලබන තොරතුරු ලේඛණ වල සත්‍යතාවය ප්‍රධාන ලේකම් විසින් පත්කරණු ලබන කමිටුවක් විසින් අදාළ ස්ථානයට සෘජුවම ගොස් අධික්ෂණය කර හෝ පරික්ෂා කර සහතික කරණු ලැබේ. සැපයුම්කරුවන් විසින් සඳහන් කරන ලද භාණ්ඩ සේවාවන් සැපයීමට නුසුදුසු යැයි හදුනාගතහොත් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කිරිමට ඔබ නුසුදුසු යැයි සලකා ඔබගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

8 භාණ්ඩ සහ සේවාවන් බෙදාහැරිමට කැමති දිස්ත්‍රික්කය/දිස්ත්‍රික්ක සැපයුම්කරුවන් විසින් සදහන් කළ යුතුය

9 අලුත්වැඩියා කිරිමට හෝ, වාහන නඩත්තු කිරිමට ලියාපදිංචි කරන ලද ගරාජය, සේවා ස්ථානයන්හි මූලික පහසුකම් අඩංගු වූ ස්ථානයක් විය යුතුය. ( අයදුම් පත්‍රය සමග ඔවුන් සතු උපකරණ සහ පුහුණුව ලැබූ සේවකයන් පිළිබද විස්තර සැපයිය යුතුය) අවශ්‍ය වුවහොත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු මගින් එහි ප්‍රමිතිය පරික්ෂා කිරිමේ සම්පූර්ණ අයිතිය ඇත.

10 සැපයුම්කරුවන්ට ලැබීමට ඇති මුදල් සදහා අත්තිකාරම් ගෙවනු නොලැබේ.

11 ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල සපයා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස්කර සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් හා බදු ලියාපදිංචි සහතිකයේ පිටපත සමඟ නැවත නොගෙවන තැන්පත් මුදල සමඟ **2017 නොවැම්බර් මස 27 වන දිනට හෝ ඊට පෙර " නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - මුදල්, උතුරු පළාත් සභාව, 61/1, නල්ලූර් හරස් වීදිය, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ කාර්යාල වේලාවන්වලදී (පෙ.ව 9.00 සිට ප'ව 3.00 දක්වා ) ඉල්ලුම්පත් භාර දිය යුතුයි' අයදුම්පත් එවන විට තැපැල් කවරයේ වම් පස උඩ කෙළවරේ **"2018 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යන්න සඳහන් කර ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

12 විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග ලියාපදිංචි කළයුතු එක් එක් උප ඇමුණුම් සේවාවන් සඳහා නැවත නොගෙවනු ලබන රුපියල් **150/-සඳහා මුදල් ඇණවුමක් "නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල් ඉ උතුරු පළාත් සභාව."** යන නමින් යාපනය තැපැල් කාර්යාලයෙන් භුවමාරු කළ හැකි පරිදි එවිය යුතුය. නැතිනම් **අංක 61/1, නල්ලූර් හරස් වීදිය, යාපනය** යන ලිපිනයේ පිහිටි **නියෝජ්‍ය ප්‍රධන ලේකම් - මුදල්** කාර්යාලයේ කාර්යාල වෙලාවන්හි (පෙ.ව 9.00 සිට ප'ව 3.00 දක්වා ) සෘජුව ම මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය අමුණා එවිය යුතුයි' එකකට වැඩි උප භාණ්ඩ හෝ උප සේවාවන් කාණ්ඩ සඳහා ලියාපදිංචිය ඉල්ලා සිටින්නේ නම් එක් එක් උප භාණ්ඩ හා උප සේවාවන් කාණ්ඩ හෝ සේවාවන් සඳහා වෙන වෙනම ඉල්ලුම් පත්‍ර නැවත නොගෙවන තැන්පත් මුදල් රුපියල් **150/-** සමඟ ඉදිරිපත් කළ යුතුයි'

13. **2017 නොවැම්බර් මස 27** වැනි දිනට පසු ලැබෙන අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. වැඩි විස්තර සඳහා **"ගණකාධිකාරී, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - මුදල්, උතුරු පළාත් සභාව" 0212220851 /0212220854 යන දුරකතන අංකය** සමඟ සම්බන්ධ විය හැක.

**<u>ආදර්ශ අයදුම් පත්‍රය</u>**

2018 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම

<u>උතුරු පළාත් සභාව</u>

1. ව්‍යාපාර ආයතනයේ නම :-
2 .ව්‍යාපාර ආයතනයේ ලිපිනය :-
3. දුරකතන අංකය :-
 ස්ථාවර දුරකථන අංකය(Land) :-
 ජංගම දුරකථන අංකය(Mobile) :-
4. පැක්ස් (Fax) අංකය :-
5. ව්‍යපාර ලියාපදිංචි අංකය :-
6. ව්‍යාපාරයේ ස්වභාවය :-

7 ලියාපදිංචි කළයුතු භාණ්ඩ/සේවාවන් වල කාණ්ඩ :-

| ඇමුණුම් අංකය | භාණ්ඩ/සේවාවන් වල විස්තර |
|---|---|
| | |

8. ගිණුම් පවත්වා ගෙන යන බැංකුවේ නම :-
9. ණය පහසුකම් සපයා ඇති කාල සීමාව :-
10. වැට් (VAT) බදු අංකය (ඇතොත්) :-
11. විද්‍යුත් තැපැල් ලිපිනය :-

12 සැපයුම් සේවාවන් ලබාදිය හැකි දිස්ත්‍රික්කවල නම් :-
(අයදුම්කරු සැපයුම් කලහැකි දිස්ත්‍රික්කය /දිස්ත්‍රික්කය දැක්වීමට "✓" සළකුණු කිරිමෙන් තෝරාගත යුතුය)

| | |
|---|---|
| යාපනය | |
| වවුනියාව | |
| මන්නාරම | |
| කිලිනොච්චිය | |
| මුලතිව් | |

මවිසින් / අපවිසින් සඳහන් කරන ලද විස්තර සියල්ලම නිවැරදි බවත් උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් පනවනු ලබන කොන්දේසි වලට අනුව භාණ්ඩ/සේවාවන් සැපයීමට සහතික වෙමු. ලියාපදිංචි ගාස්තුව වශයෙන් රුපියල් 150/- ක් වටිනා ……………… දින …………………අංක දරණ මුදල් ඇණවුම/කුවිතාන්සිය මේ සමග අමුණා ඇත.

………………………….. ……….………………………. ……………….

අයදුම්කරුගේ අත්සන නම දිනය

**අ.පත්තිනාදන්**

**ප්‍රධාන ලේකම්**

**උතුරු පළාත් සභාව**

**63, නල්ලූර් හරස් පාර,**

**නල්ලූර්, යාපනය.**